# කැලණිය විශ්වවිද්‍යාලය -2010

1 **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 **<u>මතය</u>**

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති කැලණිය විශ්වවිද්‍යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.2 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

1.2.1 **<u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති</u>**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 18 අනුව වත්කම් ඉවත්කිරීම් නිසි පරිදි ගිණුම් ගත කර නොතිබුණි.

1.2.2 **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණන නියැදි පරීක්ෂාවේදී අනාවරණය වූ එකතුව රු. 332,341,396 ක් වූ ගිණුම්කරණ අඩුපාඩු දැක්වෙන කෙටුම්පත් වාර්තාවක් 2011 ජූනි 07 දින විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත යොමුකරන ලදි. එයින් රු. 62,669,081 ක් වූ ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කර 2011 ජූලි 01 දින සංශෝධිත මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කෙරුණි.

(ආ) රාගම වෛද්‍ය පීඨයේ ඉගෙනුම ලබන විදේශීය වෛද්‍ය සිසුන්ගෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 26,299,657 ක පාඨමාලා ආදායමක් උපයාගෙන තිබූ අතර එම ආදායම්, ආදායම් හා වියදම් ගිණුමට බැර කරනු වෙනුවට පුනරාවර්ථන වියදම් දැරීමෙන් පසු ඉතිරිය ශේෂපත්‍රයේ වැය නොවූ මලධන වියදම් ගිණමට රු. 19,863,403 ක් ලෙස බැරකර තිබුණි.

(ඇ) ගාස්තු අයකරන පාඨමාලා වලින් විශ්වවිද්‍යාලය ලැබූ අතිරික්තයන් ඒ ඒ වර්ෂ වල ඉපයූ ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට නොගෙන ශේෂපත්‍රයේ විලම්බිත වගකීම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් 2010 දෙසැම්බර් 31 දිනට විලම්බිත වගකීම් ශේෂය රු. 197,860,761ක් දක්වා වර්ධනය වී තිබුණි.

(ඇ) (i) සමාලෝචිත වර්ෂයේ බාහිර විභාග උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වූ සිසුන්ගෙන් වර්ෂ 03 ක සම්මන්ත්‍රණ ගාස්තු ලෙස රු. 46,792,250 ක් අයකර තිබූ අතර ඉන් 15% ක් වූ රු. 7,018,838 ක් උපකාරක සේවා වෙනුවෙන් ආදායම් හා වියදම් ගිණුමට බැර කර ඉතිරි රු. 39,773,412 ක් සම්මන්ත්‍රණ පැවැත්වූ කාල පරිච්ඡේද වලට අනුරූපව ආදායම් හා වියදම් ගිණුමට ගැලපීම් නොකර ශේෂපත්‍රයේ විලම්භිත වගකීම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ii) ඉකුත් වර්ෂවල එසේ ආදායම් වියදම් ගිණුමට බැර නොවී පැවතුණු සම්මන්ත්‍රණ ගාස්තු තැන්පතු ගිණුමේ ශේෂය වූ රු. 80,909,035 ක් බාහිර විභාග සංචිත ගිණුමට බැරකර තිබුණි.

(ඉ) පාඨමාලා ආදායම් වියදම් ගිණුම්ගත කිරීමේදී වර්ෂ කිහිපයක් වෙනුවෙන් ලැබෙන බැවින් ඒ ඒ වර්ෂ වලට අනුරූපී ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවත්, පාඨමාලා 61 ක ආදායම් එසේ ගිණුම්ගත කර නොතිබුණු අතර වියදම් ගිණුම්ගත කිරීමේදී ඉදිකිරීම් හා අනෙකුත් ස්ථාවර වත්කම් මිලදී ගැනීම් සඳහා දරන ලද රු. 25,276,156 ක් වූ ප්‍රාග්ධන වියදම්ද ,ආදායම් වියදම් ගිණුමට එරෙහිව ලියාහැර තිබුණි.

### 1.2.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

රාගම වෛද්‍ය පීඨයේ රු. 127,205,387 ක ගොඩනැගිලි හා වටිනාකම් ලබාගත නොහැකි අනෙකුත් ස්ථාවර වත්කම් සඳහා, ස්ථාවර වත්කම් ලේඛනයක් නොතිබීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 1.2.4 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් නීති,රීති හා රෙගුලාස වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති ,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ 10 වන පරිච්ඡේදයේ 33 ඡේදය | 2001-2008 කාලසීමාව තුළ ගිවිසුම් කඩකළ ආචාර්යවරු 10 දෙනෙකුගෙන් රු.11,517,448 ක මුදලක් අයකරගෙන නොතිබුණි. ගිවිසුමේ මුල් පිටපත අස්ථාන ගත වීම හේතුවෙන් එක් ආචාර්යවරයෙකුගෙන් අයවිය යුතු |

| | |
|---|---|
| | රු. 1,358,945 ක මුදල අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද වී තිබුණි. |
| (ආ) 2006 ජනවාරි 25 දිනැති 08/2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය | චක්‍රලේඛය ප්‍රකාරව වසර 03 කට අවශ්‍ය ප්‍රධාන මිලදී ගැනීමේ හා වාර්ෂික විස්තරාත්මක මිලදී ගැනීම් සැලසුම් සකස් කර නොතිබියදී සමාලෝචිත වර්ෂයේදී රු. 208,211,381 ක් වටිනා සැපයුම් හා මූලධන වියදම් සිදු කර තිබුණි. |

1.2.5 <u>ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු</u>

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 1994 ජුනි 14 දින හා අංක 95 දරන චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා භාෂා ප්‍රවීනතා දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.948,725 ක් ගෙවා තිබුණි.

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩකටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු. 1,098,772,333 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 909,549,432 ක් විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.984,910,348 ක ප්‍රදාන හේතු කොට ගෙන සමාලෝචිත වර්ෂය සඳහා ඌනතාවය රු. 113,861,985 ක් විය. ඉකුත් වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 880,040,566 ක ප්‍රදානය හේතු කොට ගෙන එම වර්ෂයේ ඌනතාවය රු. 29,508,866 ක් දක්වා අඩුවී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු. 84,353,119 ක පිරිහීම සඳහා රු. 171,350,117 ක වියදම් වැඩිවීම බලපා තිබුණි.

2.2 **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

2.2.1 **<u>අධ්‍යයන කාර්ය සාධනය.</u>**

(අ) සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| පීඨය | බඳවා ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව | | උපාධි ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | 2009 | 2010 | 2009 | 2010 |
| විද්‍යා | 492 | 491 | 378 | 420 |
| සමාජ විද්‍යා | 599 | 1058 | 560 | 566 |
| මානව ශාස්ත්‍ර | 449 | 418 | 284 | 310 |
| වෛද්‍ය | 224 | 225 | 167 | 169 |
| වාණිජ හා කලමනාකරණ | 507 | 525 | 768 | 481 |
| පශ්චාත් උපාධි | 1673 | 1203 | 1042 | 1176 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේදී බඳවාගනු ලැබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 39% ක් සමාජ විද්‍යා පීඨයට බඳවාගෙන තිබුණි. පෙර වර්ෂයට සාපේක්ෂව එම පීඨයට බඳවාගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවේ 76% ක වැඩිවීමක් නිරීක්ෂණය විය.

(ii) සමාලෝචිත වර්ෂයේදී වාණිජ හා කලමනාකරණ, විද්‍යා, මානව ශාස්ත්‍ර සහ වෛද්‍ය පීඨ වලට සිසුන් බඳවා ගැනීමේ ප්‍රතිශතය පිළිවෙලින් 3.0 %, 3.6 %, 4.4 % සහ 1.6 % කින් අඩු වීමක් දක්නට ලැබුණි.

(iii) පසුගිය වර්ෂයට සාපේක්ෂව වාණිජ හා කලමනාකරණ පීඨයේ උපාධි ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවේ 37% ක අඩුවීමක් නිරීක්ෂණය වන අතර පසුගිය වසරට සාපේක්ෂව විශ්වවිද්‍යාලයේ උපාධි ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවේ 9.7% ක සමස්ථ අඩුවීමක් දක්නට ලැබුණි.

(iv) පසුගිය වසරට සාපේක්ෂව පශ්චාත් උපාධි සඳහා බඳවාගනු ලැබූ ශිෂ්‍ය සංඛයාවේ 28% ක අඩුවීමක් හා පශ්චාත් උපාධි ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවේ 12.8% ක වැඩිවීමක් නිරික්ෂණය විය.

(ආ) <u>වාර්ෂික පර්යේෂණ පරිසංවාද (Symposium)</u>

පහත සඳහන් නිරික්ෂණ කරනු ලැබේ.

(i) විශ්වවිද්‍යාලයේ මෙහෙවර ප්‍රකාශය අනුව එක් ප්‍රධාන අරමුණක් වන්නේ පර්යේෂණ තුලින් නව දැනුම සොයාගැනීම වුවත් සමස්ථයක් ලෙස 2008,2009 හා 2010 වර්ෂවලදී පවත්වන ලද වාර්ෂික පර්යේෂණ පරිසංවාද වලදී ඉදිරිපත් වූ පර්යේෂණ සංඛ්‍යාව පිළිවෙලින් 170, 140 හා 134 ක් ලෙස ක්‍රමයෙන් අඩුවන ප්‍රවනතාවයක් නිරික්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂයේදී පවත්වන ලද වාර්ෂික පර්යේෂණ පරිසංවාදයට අනුව සමස්ථ ආචාර්යවරුන්ගෙන් පර්යේෂණ ඉදිරිපත් කල ආචාර්යවරුන් 28% ක් වැනි අඩු ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(ii) 2008 , 2009 හා 2010 වර්ෂ වලදී පිළිවෙලින් රු. 2,155,288 , රු. 2,403,601 හා රු. 2,021,202 ක මුදලක් අභ්‍යන්තර පර්යේෂණ සඳහා වැයකර ඇතත් එම මුදල් වැයකර කරන ලද පර්යේෂණ වාර්තා පරිසංවාදයන්ට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) <u>විභාග ප්‍රතිඵල නිකුත් කිරීම</u>

පහත සඳහන් නිරික්ෂණ කරනු ලැබේ.

(i) විශ්වවිද්‍යාලයේ සංශෝධිත වාර නියමයට අනුව විද්‍යා පීඨයේ සිව්වන වසරේ ප්‍රථම අර්ධ වර්ෂයේ හා දෙවන අර්ධ වර්ෂයේ විභාග ප්‍රතිඵල නිකුත් කල යුතු අවසාන දිනය පිළිවෙලින් 2010 මැයි 18 හා 2010 නොවැම්බර් 29 දින වුවද සිසුන් 06 දෙනෙක ඉගෙනුම ලැබූ ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යයන අංශයේ ප්‍රථම අර්ධ වර්ෂයේ ප්‍රතිඵල නිකුත් කිරීමට මාස 09 ක් ද , දෙවන අර්ධ වර්ෂයේ ප්‍රතිඵල නිකුත් කිරීමට මාස 03 ක් ද , ප්‍රමාද වී තිබුණි.

(ii) විද්‍යා පීඨයේ 2008/2009 අධ්‍යයන වර්ෂයට අදාල සංශෝධිත අධ්‍යයන වාර නියමයට අනුව ප්‍රථම අර්ධ වර්ෂයෙහි ප්‍රතිඵල නිකුත් කිරීම උද්භිද විද්‍යා අධ්‍යයන අංශයේ දින 239 කින්ද, රසායන විද්‍යා අධ්‍යයන අංශයේ දින 237 කින්ද, ගණිත අංශයේ දින 79 කින්ද , ප්‍රමාද වී තිබුණි. කර්මාන්ත පරිපාලන, සංඛ්‍යාන හා පරිගණක විද්‍යා සහ සත්වවිද්‍යා අධ්‍යයන අංශවල දින 33 සිට දින 54 දක්වා ප්‍රතිඵල නිකුත් කිරීම ප්‍රමාද වී තිබුණි.

දෙවන අර්ධ වර්ෂයේදී විද්‍යා පීඨයේ අධ්‍යයන අංශ 07 හි ප්‍රතිඵල නිකුත් කිරීම දින 16 සිට 64 දක්වා ප්‍රමාද වී තිබුණි.

(ඇ) <u>ඒක ශිෂ්‍ය පිරිවැය</u>

සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ මෙහෙයුම් වියදම රු. 1,324,267,220 ක් වූ අතර අධ්‍යයන කටයුතු වල නිරත වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 8547 ක් විය. ඒ අනුව වර්ෂය සඳහා ඒක ශිෂ්‍ය සාමාන්‍ය පිරිවැය රු.154,939 ක් වූ අතර පසුගිය වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය වූ රු. 140,774 හා සැසඳීමේදී රු. 14,169 ක් හෙවත් 10%ක වැඩිවීමක් අනාවරණය විය

2.2.2 <u>නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යයන අංශය යටතේ පාලනය වන A/12/102 හා A/12/105 දරන පරිගණක විද්‍යාගාර දෙක 2011 ජූනි 30 වන විට මාස 09 කට වැඩිකාලයක් ඌන උපයෝජිතව තිබූ බව සිසුන් අත්සන් කරන ලද ලේඛන අනුව නිරීක්ෂණය වූ අතර භෞතික විගණන පරීක්ෂාවේදී ද , එම විද්‍යාගාර භාවිතයට නොගෙන වසා දමා ඇති බව තහවුරු විය.

(ආ) කැලණිය විශ්වවිද්‍යාලයේ බාහිර විභාග ඒකකයේ සිට ප්‍රදේශ කිහිපයක පිහිටි මධ්‍යස්ථාන වෙත සම්මන්ත්‍රණ සජීවිව විකාශය කිරීම සහ සිසුන් සමඟ සජීවිව සාකච්ඡා කිරීමේ අරමුණින් ශ්‍රව්‍ය දෘශ්‍ය ජාල පද්ධතියක් සපයා සවිකිරීම සඳහා 2009 වර්ෂයේ අගෝස්තු මාසයේදී රු. 23,383,000 ක පිරිවැයක් දරා තිබුණද, එය සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඇ) වෛද්‍ය පීඨයේ පර්යේෂණ කටයුතු සඳහා ජාතික විද්‍යා පදනමෙන් ලබා දී තිබූ රු.694,387 ක මුදල, පර්යේෂණ සිදුනොකර වර්ෂයකට වැඩි කාලයක් රඳවා ගෙන තිබුණි. උපකුලපතිවරයාගේ ප්‍රකාශය අනුව පර්යේෂණයේ ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා මුදල් ප්‍රමාණවත් නොවන බැවින් ගිවිසුම අවලංගු කොට මුදල් ආපසු ගැනීමට කටයුතු කර ඇත.

(ඈ) ස්ථාවර වත්කම් ලේඛණය පිළියෙල කර ගැනීම සඳහා 2008 වර්ෂයේදී මිල ගණන් කැඳවා තිබූ අතර විශ්වවිද්‍යාලයේ අවශ්‍යතා අනුව නිසි ඇගයීමකට භාජනය කර සම්මත මෘදුකාංගයන් මිලදී ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබූ අතර කොන්ත්‍රාත්කරු විසින් වත්කම් ලේඛණගත කිරීමේදී ඒවායේ පිහිටි ස්ථානය/කාර්යාලය පදනම් කරගෙන පිළියෙල කිරීම නිසා වත්කම් වර්ග අනුව අවශ්‍ය තොරතුරු එම පැකේජයෙන් ලබාගත නොහැකි වී තිබුණි.එම වත්කම් ලේඛණය 2009 වර්ෂයෙන් පසු යාවත්කාලීන කර ද , නොතිබුණි.

2.2.3 **කොන්ත්‍රාත් පාලනය**

පළමු කොන්ත්‍රාත්කරු විසින් අත්හැර දැමූ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය සඳහා වූ ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව, ඉතිරි වැඩ නිමකිරීම සඳහා දෙවෙනි කොන්ත්‍රාත්කරුවෙකුට 2008 ජනවාරි 28 දින රු. 142,672,942 කට පවරා තිබුණි. 2010 ජනවාරි 26 දින වන විට වර්ෂ 02 කින් වැඩ නිම කිරීම සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය 75% ක් තරම් අඩු මට්ටමක පැවතුණි.

2.2.4 **හඳුනාගත් අඩුපාඩු**

රාගම වෛද්‍ය පීඨයෙහි විදුලි ගාස්තු ගෙවීම ප්‍රමාද කිරීම නිසා දඩ මුදල් වශයෙන් රු.94,216 ක් ඉකුත් වර්ෂය සඳහාද ,රු.47,657 ක් සමාලෝචිත වර්ෂය සඳහාද ,ගෙවීම් කර තිබුණි.

2.2.5 **අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම් හා වියදම් සමඟ තථ්‍ය ආදායම් හා වියදම් සැසඳීමේදී ආදායම් හා වියදම් විෂයයන් අතර 10% සිට 100% දක්වා විචලනයන් නිරීක්ෂනය වූයෙන් අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණි.

3. **පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත දැනුම් දෙන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) විවිධ අත්තිකාරම්

(ආ) පුස්තකාල පරිපාලනය

(ඇ) ගිණුම්කරණය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඉ) නේවාසිකාගාර පරිපාලනය

(ඊ) ගිවිසුම් හා බැඳුම්කර

(උ) වාහන උපයෝජනය

(ඌ) නිශ්කය හා ඌන උපයෝජිත වත්කම්

(එ) සේවක පරිපාලනය